සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය
சமூகவலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

4වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4வதுமாடி,செத்சிறிபாய பத்தரமுல்ல
4th floor, Sethsiripaya ,Battaramulla


# දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
# வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
# Department of Divineguma Development

මගේ අංකය / எனதுஇல / My No: DDD/HO/MF/05/02/01

ඔබේ අංකය / உமது இல / Your No: ........................................

දිනය / திகதி / Date: 2017/01/04

**දිවිනැගුම ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක :- දි.ප්‍ර.බැ. 2017/01**

**සියළුම දිවිනැගුම ප්‍රජාමූල බැංකු / බැංකු සමිති කළමණාකරුවන්,**

**<u>දිවිනැගුම ප්‍රජාමූල බැංකු / බැංකු සමිති පරිශ්‍රය ආශ්‍රිතව හරිත උද්‍යාන බිහිකිරීම.</u>**

## 01. හැඳින්වීම :-

තිරසාර වූ ක්ෂුද්‍රමූල්‍ය බැංකු පද්ධතියක් අඩු ආදායම්ලාභී ප්‍රජාව වෙනුවෙන් බිහිකිරීමේ අරමුණ පෙරදැරි කරගෙන දිවිනැගුම ප්‍රජාමූල බැංකු / බැංකු සමිති පද්ධතිය ආශ්‍රිතව "හරිත උයන් " බිහිකිරීමේ සංකල්පය ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.

මේ යටතේ බැංකු / බැංකු සමිති පරිශ්‍රය ආශ්‍රිතව පවතින ඉඩකඩ ප්‍රයෝජනයට ගනිමින් පරිසර හිතකාමී බෝග වගා කරමින් පරිසරයට හා ප්‍රජාවට එම පරිසරයෙන් උපරිම ප්‍රයෝජනයක් ලබාගැනීමටත් පරිසර හිතකාමී වගාවන් ඒ ආශ්‍රිතව ඇතිකරලීමත් තුලින් මිනිසාගේ පැවැත්මට වඩාත් සුවිශේෂ වූ පරිසරයක් බිහිකිරීමටත් මෙම හරිත උයන් බිහිකිරීම තුලින් අපේක්ෂා කෙරේ.

## 02. ක්‍රියාත්මක ක්‍රමවේදය :-

02.1. බැංකු / බැංකු සමිති පරිශ්‍රයේ පවතින ඉඩකඩ ප්‍රමාණය මෙහි දී වැදගත් වේ. එනම් ඔබ බැංකුව / බැංකු සමිතිය පිහිටි ඉඩමේ ප්‍රමාණය අවම පර්චස් 15 ඉක්මවා තිබේනම් පමණක් මෙම "හරිත උයන් " සංලක්පය ඔබගේ පරිසරය ආශ්‍රිතව බිහිකර ගැනීමට අවකාශ ඇත.

## 03. "හරිත උයන් " තුල වගා කල හැකි බෝග වර්ග

03.1. මෙම භූමි ප්‍රමාණය ප්‍රයෝජනයට ගනිමින් ඔබ ප්‍රදේශයට අවේනික, එම ප්‍රදේශයේ වගා කල හැකි දිගුකාලීන බෝග කෙරෙහි අවධානය යොමු කල යුතුය.


අධ්‍යක්ෂ ජනරාල්
பணிப்பாளர் தலைமையதிபதி
Director General
Tel:011-2873802/2872202
Fax -011-2887280
dg@divineguma.gov.lk

අතිරේක අධ්‍යක්ෂජනරාල්
மேலதிகபணிப்பாளர்தலைமையதிபதி
Additional DirectorGeneral
011-2871672
011-2871672
adg@divineguma.gov.lk

අධ්‍යක්ෂ (පාලන)
பணிப்பாளர்(நிர்வாகம்)
Director (Administration)
011-2873799
011-2873996
diradmin@divineguma.gov.lk

ප්‍රධාන ගණකාධිකාරී
பிரதான கணக்காளர்
Chief Accountant
011-2869742
011-2869742
finance@divineguma.gov.lk

කාර්යාලය
அலுவலகம்
Office
011-2887280
**011- 2887722 (Hotline)**
**Prabhu-desktop - Nimeshi**

03.2. උදාහරණ වශයෙන් සෑම ප්‍රදේශයකම වගා කල හැකි අඹ,රඹුටන්,පේර,ජම්බු,කටු අනෝදා,අලිපේර වැනි බෝග මෙම හරිත උයන තුල වගා කිරීම කෙරෙහි අවධානය යොමු කල යුතුය.

03.3. මීට අමතරව, දිගුකාලීන වශයෙන් පවතින බෙහෙත් පැලෑටි ලෙස කොහොඹ,බෙලි,නෙල්ලි,රණවරා වැනි ශාකයන් ද මෙම "හරිත උයන් " භූමිය තුල වගා කල යුතුය.

**04. "හරිත උයන් " බිහිකිරීම සිදුකල හැකි ආකාරය**

04.1. ඔබගේ බැංකු / බැංකු සමිතිය පවතින භූමියේ ඇති ඉඩකඩ ප්‍රමාණය මෙම කාර්යය සඳහා මනා ලෙස සකසා ගැනීම.

මේ සඳහා ප්‍රතිලාභීන්ගේ සහය ද යොදා ගනිමින් භූමිය සකස් කරගත හැකි අතර අවශ්‍ය පැල මිලට ගැනීම,පොහොර මිලට ගැනීම ආදී කාර්යයන් සඳහා බැංකුවේ, " පොදු සුභසාධන අරමුදල " තුලින් රු. 10,000/- ක මුදලක් ලබාගැනීම සඳහා අනුමැතිය ලබාදෙමි.

04.2. ඒ අනුව අදාල පැල වර්ග මනා ලෙස භූමිය තුල සිටුවා නඩත්තු කිරීමේ කාර්යය බැංකු කාර්යය මණ්ඩලය විසින් සිදුකල යුතුය.

ග්‍රාමීය මෙන්ම නාගරික ප්‍රදේශ වල පවතින බැංකු ආශ්‍රිතව ද මෙම ඉඩකඩ ප්‍රමාණය පවතී නම් "හරිත උයන් " බිහිකර ගැනීමේ අවස්ථාව පවතී.

"හරිත උයන් " බිහිකර ගත් බැංකු / බැංකු සමිති පිළිබඳ විස්තර වාර්තාව ඉදිරියේ දී දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන් මඟින් ලබාගැනීමට අපේක්ෂා කෙරේ.

**පරිසර හිතකාමී හරිත උයනක් බිහිකර ගැනීම තුලින් ජාතික කර්තව්‍යයකට දායකත්වයක් ලබාදීම කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවනු ඇතැයි අපේක්ෂා කරමි.**

**නීල් බණ්ඩාර හපුහින්න,**
**අධ්‍යක්ෂ ජනරාල්.**

**පිටපත් :-**

01. සියළුමදිස්ත්‍රික්දිවිනැගුමඅධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික්ලේකම්කාර්යාලය - කා.දැ.ස.
02. ප්‍රාදේශීයලේකම්වරුන්, ප්‍රාදේශීයලේකම්කාර්යාලය - කා.දැ.ස.
03. ප්‍රධානඅභ්‍යන්තරවිගණක, දිවිනැගුමසංවර්ධනදෙපාර්තමේන්තුව - කා.දැ.ස.